සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

9727

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2020
Year End Evaluation

| ශ්‍රේණිය / தரம் / Grade | 11 | විෂයය / பாடம் / Subject | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය I,II | පත්‍රය / வினாத்தாள் / Paper | I | කාලය / காலம் / Time | පැය 03 |
|---|---|---|---|---|---|---|---|

සැලකිය යුතුයි:
(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1 , 2 , 3 , 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

(01) පහත දැක්වෙන ද්විතියික මතක වර්ග අතුරින් ප්‍රකාශ මාධ්‍ය උපක්‍රම පමණක් ඇතුලත් පිළිතුර කුමක් ද?
(1) සංයුක්ත තැටි (CD), සංඛ්‍යාංක බහුවිධ තැටි (DVD), ආරක්ෂා සහිත අංකිත කාඩ් (SD Card)
(2) සංයුක්ත තැටි (CD), සංඛ්‍යාංක බහුවිධ තැටි (DVD), බ්ලූරේ තැටි (BD)
(3) සංයුක්ත තැටි (CD), බ්ලූරේ තැටි (BD), ආරක්ෂා සහිත අංකිත කාඩ් (SD Card)
(4) සංයුක්ත තැටි (CD), සංඛ්‍යාංක බහුවිධ තැටි (DVD), චුම්බක පටි (Magnetic Tape)

(02) දත්ත සම්ප්‍රේෂණ මාධ්‍ය පිළිබඳ සත්‍ය ප්‍රකාශය කුමක් ද?
(1) සමාක්ෂක කේබල නියමු නොවූ මාධ්‍ය සඳහා උදාහරණයකි.
(2)වැසුණු ඇඹරූ කම්බි යුගලයෙහි විශේෂත්වය ආලෝකය පරාවර්තනය වීමෙන් දත්ත සම්ප්‍රේෂණය වීමයි.
(3) වේගවත්ම දත්ත සම්ප්‍රේෂණ නියමු මාධ්‍ය ප්‍රකාශ තන්තුය.
(4) රූපවාහිනි දුරස්ථ පාලකවල දත්ත සම්ප්‍රේෂණය අධෝරක්ත කිරණ මඟින් සිදුවේ.

(03) සසම්භාවී පිවිසුම් මතකය (Random Access Memory) සම්බන්ධයෙන් අසත්‍ය ප්‍රකාශය කුමක් ද?
(1) මෙහි ප්‍රධාන කාර්යය වන්නේ මධ්‍ය සැකසුම් ඒකකයට අවශ්‍ය දත්ත, උපදෙස් තාවකාලිකව රඳවා තබා ගැනීමයි.
(2) මෙය පරිගණකයේ මව්පුවරුව මත පිහිටා ඇති අතර ප්‍රධාන මතකය ලෙස ද හැඳින්වේ.
(3) මෙය නශ්‍ය මතකයක් වන අතර වාරක මතකයට වඩා වේගවත් බවින් අඩු ය.
(4) පරිගණකයේ මූලික ක්‍රියාවලියට අවශ්‍ය දත්ත සහ විධාන මෙම මතකය තුළ තැන්පත් කර ඇත.

(04) එක්තරා පුවත්පතක ප්‍රධාන සිරස්තලය වූයේ "ධීවර කර්මාන්තයේ දී යොදා ගනු ලබන .................... මඟින් මසුන් ගහණය බහුලව පවතින ස්ථාන කිහිපයක් හඳුනා ගැනේ" යන්න ය. මෙහි දැක්වෙන හිස්තැනට වඩාත් සුදුසු වචනය කුමක් ද?
(1) පියවූ පරිපථ රූපවාහිනි කැමරා පද්ධතිය
(2) විදුලි සංඥා ලාම්පු
(3) සංවේදක උපකරණ
(4) හැඳුනුම් සංකේත ක්‍රමය



Scanned with CamScanner

(05) ප්‍රශ්න විචාරාත්මක වැඩසටහනක් අතරතුර දී විකුම්ට පහත දී ඇති කරුණු අතරින් දුරස්ථ අධ්‍යාපනයේ දක්නට ලැබෙන ගති ලක්ෂණ මොනවාදැයි තේරීමට අවස්ථාව ලැබුණි.

A. දෛනික කාල සටහනක් අනුව පාසලේ සිටම තම ඉගෙනුම් කටයුතු සිදු කිරීමට හැකියාව ලැබීම.

B. අංකිත පුස්තකාල භාවිතයට ගැනීමේ හැකියාව.

C. මාර්ගගත ගුරුවරයෙකු හා සම්බන්ධ වීමට ඇති නොහැකියාව.

D. උපදේශන සේවා පහසුකම් ලබා ගැනීමට ඇති හැකියාව.

E. මාර්ගගතව පැවරුම් සඳහා පිළිතුරු උඩුගත කිරීමේ හැකියාව.

ඉහත වැඩසටහනේ විකුම් ඔබ නම්, ඔබ විසින් තෝරා ගනු ලබන දුරස්ථ අධ්‍යාපනයේ නිවැරදි ගති ලක්ෂණ දක්වෙන වරණය කුමක් ද?

(1) A, B හා C මඟින්    (2) B, C හා D මඟින්

(3) A, B හා D මඟින්    (4) B, D හා E මඟින්

(06) පරිගණක කෙවෙනි සම්බන්ධව පහත ප්‍රකාශ අතරින් අසත්‍ය ප්‍රකාශය කුමක් ද?


(1) HDMI කෙවෙනිය පරිගණක තිරය, බහුමාධ්‍ය ප්‍රක්ෂේපකය සම්බන්ධ කිරීමට යොද ගනියි.

(2) පරිගණකය අන්තර්ජාලයට සම්බන්ධ කිරීමට යොදාගනු ලබන මොඩමය (Modem) පරිගණකට සම්බන්ධ කිරීමට ශ්‍රේණිගත කෙවෙනිය (Serial port) භාවිතා කරයි.

(3) වර්තමානයේ බෙහොමයක් මුද්‍රණ යන්ත්‍ර පරිගණකයට සම්බන්ධ කිරීමට යොදා ගනු ලබන්නේ USB කෙවෙනියයි.

(4) වීඩියෝ කෙවෙනිය (VGA) දෘෂ්‍ය මෙන්ම ශ්‍රව්‍ය ප්‍රතිදාන ලබාගැනීමේ උපාංග පරිගණකයට සම්බන්ධ කිරීමට භාවිතා කරයි.

(07)




ඉහත රූපසටහනට අනුව දත්ත සම්ප්‍රේෂණය සිදු වී ඇති ක්‍රමය හා එයට උදාහරණය පිළිවෙලින් දක්වා ඇති වරණය කුමක් ද?

(1) ඒකපථ, රූපවාහිනි දර්ශන නැරඹීම    (3) අර්ධ ද්විපථ, දුරකථන සංවාද

(2) පූර්ණ ද්විපථ, වෝකි ටෝකි    (4) පූර්ණ ද්විපථ, දුරකථන සංවාද

(08) $205_{10}$ පිළිවෙළින් ෂඩ්දශමය සංඛ්‍යාවකට හා අෂ්ටමය සංඛ්‍යාවකට පරිවර්තනය කළ විට ලැබෙන නිවැරදි පිළිතුර කුමක් ද?

(1) $1213_{16}$ හා $255_{8}$    (2) $DC_{16}$ හා $513_{8}$

(3) $BD_{16}$ හා $205_{8}$    (4) $CD_{16}$ හා $315_{8}$

(09) B අක්ෂරයේ ASCII අගය $66_{10}$ ලෙස ද b අක්ෂරයේ ASCII අගය $98_{10}$ ලෙස ද නිරූපණය වේ නම්, ASCII වගුවට අනුව G හා g අක්ෂරවල ද්විමය නිරූපණය කුමක් ද?

(1) 1000111 හා 1100111

(2) 1100111 හා 1000111

(3) 1010111 හා 1001010

(4) 1000011 හා 1100010



Scanned with CamScanner

(10) පහත සඳහන් වගන්ති අතරින් කවරක් සත්‍ය වන්නේ ද?

A. $5B_{16}$, $1011011_2$ ට තුල්‍ය වේ.

B. $110111001_2$ , $661_8$ ට තුල්‍ය වේ .

C. 235, $EB_{16}$ ට තුල්‍ය වේ.

(1) A හා B (2) B හා C

(3) A හා C (4) A, B, C සියල්ලම

(11) පහත දැක්වෙන වගන්ති සලකන්න.

A. මෙහෙයුම් පද්ධති මෘදුකාංග, යෙදුම් හා පද්ධති මෘදුකාංග ලෙස කොටස් දෙකකට වර්ගීකරණය කළ හැක.

B. ප්‍රති වෛරස මෘදුකාංග හා තැටි ආකෘති කරන මෘදුකාංග, යෙදුම් මෘදුකාංග වේ.

C. සසම්භාවී ප්‍රවේශ මතකය හැසිරවීම මෙහෙයුම් පද්ධතිය මඟින් සිදුකරනු ලබයි.

ඉහත වගන්ති අතරින් නිවැරදි වන්නේ,

(1) A පමණි (2) C පමණි

(3) A සහ B පමණි (4) B සහ C පමණි

12) මෙහෙයුම් පද්ධති සම්බන්ධයෙන් පහත දී ඇති ප්‍රකාශ සලකා බලන්න.

A. Linux පාදක මෙහෙයුම් පද්ධතිවලදී ප්‍රතිභාගීකරණය සඳහා අමතර උපයෝගි වැඩසටහනක අවශ්‍යතාවයක් ඇති නොවේ.

B. ගොනුවක කොටස් දෘඩ තැටියේ විවිධ ස්ථානවල තැන්පත් වීම හේතුවෙන් ඛණ්ඩනය සිදු වේ.

C. පරිගණකයක පංගු බෙදීම සිදුකළ යුත්තේ මෙහෙයුම් පද්ධතියක් ස්ථාපනය කළ පසුය.

ඉහත කුමන වගන්ති නිවැරදි වේද?

(1) A හා B (2) B හා C (3) A හා C (4) A, B, C සියල්ලම

- ප්‍රශ්න අංක 13 සිට 15 දක්වා ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට දී ඇති පැතුරුම්පත් කොටස සලකන්න.

(13) මෙම පැතුරුම්පතෙහි A වෘත්තය සඳහා පරිධිය සෙවීමට C2 කෝෂය තුළ ලිවිය යුතු සූත්‍රය කුමක් ද? (වෘත්යක පරිධිය = 2* pi* r) B හා C වෘත්ත වලද මෙම සූත්‍රය භාවිතා කර පරිධිය සෙවිය යුතු බව සලකන්න.

| | A | B | C | D |
|---|---|---|---|---|
| 1 | වෘත්තය | අරය | පරිධිය | |
| 2 | A | 4 | 25.14 | |
| 3 | B | 8 | 50.29 | |
| 4 | C | 16 | 100.57 | |
| 5 | අඩුම අගය | 4 | 25.14 | |
| 6 | | | | |
| 7 | pi | 3.14 | | |
| 8 | | | | |

(1) =2 * B7 * B2

(2) =2 * B$7 * B2

(3) =2 * $B7 * B2

(4) =2* B7 * B$2

(14) ඉහත A වෘත්තය සඳහා ලබාගත් පරිධිය C වෘත්තයේ පරිධිය ලබා ගැනීම සඳහා C4 කෝෂයට පිටපත් කළේ නම් එහි දිස්වන සූත්‍රය කුමක් ද?

(1) =2 * B7 * B4 (2) =2 * $B7 *B4

(3) =2 * B7 * B$4 (4) =2 * B$7 * B4



Scanned with CamScanner

(15) ඉහත පැතුරුම් පතෙහි අඩුම පරිධිය සෙවීම සඳහා C5 කෝෂය තුළ ලිවිය හැකි සූත්‍රය සඳහා නිවැරදි සූත්‍ර පහත සූත්‍ර අතරින් මොනවා ද?

A. =MIN (C2:C4)

B. =MIN(C2:C3, C4)

C. =MIN(C2, C3, C4)

(1) A හා B පමණි
(2) A හා C පමණි
(3) B හා C පමණි
(4) A, B හා C යන සියල්ලම


(16) පරිගණකයක් තුළ පහත සඳහන් කාර්යයන් සිදු කිරීමට භාවිත කළ හැකි කෙටි මං යතුරු (shortcut keys) නිවැරදිව දක්වා ඇති පිළිතුරු කුමක් ද?

Ⓐ ලේඛනය විවෘත කිරීමට,
Ⓑ කර්සරය ලේඛනයේ මුලට ගැනීමට
Ⓒ ලේඛනයේ අඩංගු වචනය වෙනුවට වෙනත් වචනයක් ප්‍රතිස්ථාපනය කිරීමට
Ⓓ ලේඛනය මුද්‍රණය කිරීමට

Ⓟ CTRL + HOME
Ⓠ CTRL + P
Ⓡ CTRL + O
Ⓢ CTRL + H


(1) Ⓐ → Ⓟ, Ⓑ → Ⓡ, Ⓒ → Ⓢ, Ⓓ → Ⓟ
(2) Ⓐ → Ⓡ, Ⓑ → Ⓢ, Ⓒ → Ⓠ, Ⓓ → Ⓟ
(3) Ⓐ → Ⓡ, Ⓑ → Ⓟ, Ⓒ → Ⓢ, Ⓓ → Ⓠ
(4) Ⓐ → Ⓢ, Ⓑ → Ⓟ, Ⓒ → Ⓡ, Ⓓ → Ⓠ

(17) නිමාලි විසින් නවක සිසුන් පිළිගැනීම සඳහා සකසන ලද ඉ-සමර්පණයේ කදා පෙන්වන ආකාර කිහිපයක් පහත දක්වා ඇත.



ඒ සඳහා භාවිතා කළ හැකි දසුන් තීරුවේ නිරූපක පිළිවලින් දක්වා ඇත්තේ කුමන පිළිතුරේ ද?

(1) Ⓐ→② , Ⓑ→④ , Ⓒ→③, Ⓓ→④
(2) Ⓐ→② , Ⓑ→④ , Ⓒ→③, Ⓓ→①
(3) Ⓐ→④ , Ⓑ→② , Ⓒ→③, Ⓓ→①
(4) Ⓐ→③ , Ⓑ→② , Ⓒ→①, Ⓓ→④






Scanned with CamScanner

(18) පහත දැක්වෙන්නේ ගුණාත්මක ඉ-සමර්පණයක අඩංගු ලක්ෂණ නම් ඒ අතරින් සත්‍ය වන්නේ කුමන ප්‍රකාශන ද?

| | |
|---|---|
| P | කදාවක අඩංගු අකුරුවල විශාලත්වය පොයින්ට් 15 හෝ ඊට අඩු විය යුතුය. |
| Q | චලන චිත්‍ර සහ වීඩියෝ ඇතුළත් කරන විට එක් කදාවකට ඉන් එකක් පමණක් ඇතුළත් කළ යුතුය. |
| R | එක් කදාවක වාක්‍ය පේළි 6-9 ප්‍රමාණයක් තිබීම සුදුසු ය. |
| S | ප්‍රේක්ෂකයාගේ අරමුණ ඉලක්ක ගත විය යුතුය. |

(1) P හා Q පමණි
(2) Q හා R පමණි
(2) Q, R හා S පමණි
(4) P, R හා S පමණි

• ප්‍රශ්න අංක 19 සිට 22 තෙක් ප්‍රශ්න සඳහා පදක වී ඇත්තේ ABC ආයතනයේ දත්ත සමුදායක වගුවල කොටසකි. එම ආයතනයේ සේවකයින් අනුයුක්ත කර තිබෙන ව්‍යාපෘති පිළිබඳ දත්ත ආචයනය කිරීම සඳහා මෙම වගු භාවිත කරයි.

**Employee** වගුව (සේවකයින් පිළිබඳ විස්තර අඩංගු වේ)

| Employee_no | Employee_name | Address | Tel_no |
|---|---|---|---|
| E001 | නිම්න්ත සිල්වා | 29, ගාලු පාර, පානදුර | 0715689231 |
| E002 | අයිරාංගනී ජයවර්ධන | 2/A, තිස්ස මාවත, ගල්කිස්ස | 0772892525 |
| E003 | ශෙනාලි පෙරේරා | 92B, විජය පාර, දෙහිවල | 0772593519 |
| E004 | ගනේෂ් සිල්වරාජා | 256A, වෙරන්ස් නිවාස සංකීර්ණය, වැල්ලවත්ත | 0769812651 |
| E005 | අයිෂා මොහොමඩ් | 36/12, පන්සල පාර, මරදාන | 0785912463 |

Project වගුව (ආයතනයේ ක්‍රියාත්මක ව්‍යාපෘති පිළිබඳ විස්තර අඩංගු වේ.)

| Project_no | Project_name |
|---|---|
| P001 | Crypto |
| P002 | Felix |
| P003 | bitcoin |
| P004 | trulia |

Employee_assign වගුව (සේවකයන් අනුයුක්තව සිටින ව්‍යාපෘති පිළිබද විස්තර අඩංගු වේ).

| Employee_no | Project_no | Start_date | End_date |
|---|---|---|---|
| E001 | P003 | 2020/01/10 | 2020/07/25 |
| E003 | P001 | 2020/01/11 | |
| E005 | P004 | 2020/01/11 | 2020/06/10 |
| E002 | P003 | 2020/01/12 | 2020/07/25 |
| E001 | P002 | 2020/02/10 | |
| E005 | P001 | 2020/02/10 | |

(19) Employee වගුවේ ක්ෂේත්‍ර සංඛ්‍යාව කොපමණ ද?

(1) 2 (2) 3 (3) 4 (4) 5

(20) දත්ත සමුදායේ ආගන්තුක යතුරක් සඳහා උදාහරණයක් වන්නේ කුමක් ද?

(1) Employee වගුවේ Employee_no
(2) Employee_assign වගුවේ Employee_no
(3) Employee_assign වගුවේ Start_date
(4) Project වගුවේ Project_no



Scanned with CamScanner

(21) Felix ව්‍යාපෘතියේ සේවය කරන සේවකයා කවුරුන් ද?

(1) අයිෂා මොහොමඩ් (2) අයිරාංගනී ජයවර්ධන

(3) ශෙනාලි පෙරේරා (4) නිමන්ත සිල්වා

(22) නව සේවකයකු ආයතනයට බඳවා ගැනීමෙන් පසු දැනට පවතින ව්‍යාපෘතියකට අනුයුක්ත කරයි. මෙ කාර්යය සඳහා යාවත්කාලීන කළ යුතු වගු(ව) කුමක් ද?

(1) Employee වගුව හා Project වගුව

(2) Project වගුව හා Employee _ assign වගුව

(3) Employee_ වගුව හා Employee_assign වගුව

(4) Employee වගුව, Project වගුව හා Employee_assign වගුව

(23) පරිගණක පාදක තොරතුරු පද්ධති සම්බන්ධයෙන් පහත කවරක් නිවැරදි වන්නේ ද?

A. පරිගණක පාදක තොරතුරු පද්ධති විසින් කිසිවිටෙකත් දෝෂ ඇති නොකෙරේ.

B. මෙම පද්ධති මඟින් තොරතුරු සකස් කර ගැනීමට ඉතා අඩු කාලයක් ගත වේ.

C. අනවසර පිවිසීම්, පරිගණක වෛරස වැනි දෑ නිසා පරිගණක පාදක තොරතුරු පද්ධතියක දත්ත සඳහා ආරක්ෂාව අත්යුරු පද්ධතිවලට සාපේක්ෂව අඩුය.

(1) A පමණි (2) B පමණි

(3) A හා B පමණි (4) A,B හා C යන සියල්ලම

(24) පහත දැක්වෙන ප්‍රකාශ අතුරින් මෘදුකාංග පද්ධති පරීක්ෂා කිරීමේ ක්‍රම පිළිබඳව කවරක් අසත්‍ය වන්නේද?

(1) පද්ධති පරීක්ෂාවේදී මෙහෙයුම් පද්ධතිය සමග නව පද්ධතියේ අන්තර් ක්‍රියාකාරිත්වය පරීක්ෂා කෙරේ.

(2) ඒකක පරීක්ෂාවේදී පද්ධතියේ ඒකක වෙන වෙනම පරීක්ෂා කෙරෙන අතර මෙය පළමුවෙන්ම සිදු කෙරෙන පරීක්ෂාවයි.

(3) සමස්ත පරීක්ෂාවේදී සම්පූර්ණ පද්ධතියට අදාල අදාන ලබා දෙමින් අපේක්ෂිත ප්‍රතිදාන ලැබේදැයි පරීක්ෂා කෙරේ.

(4) ප්‍රතිග්‍රහණ පරීක්ෂාවේදී පරිශීලකයින්ට නව පද්ධතිය භාවිතා කිරීමට ඉඩ සලසයි.

(25) පහත පෙන්වා ඇති (රූපය 1) හි දැක්වෙන වෙබ් පිටු කොටස HTML ප්‍රභවය ①-③ දක්වා ලේබල මඟින් දැක්වෙන උසුලන නොමැතිව (රූපය 2) හි පෙන්වා දී ඇත.

| | |
|---|---|
| *Quarantine* **STOP**<br>~~COVID - 19~~ | <center><h2><①> Quarantine</①><br><B>STOP</B><br><②> <③> COVID - 19 </③></h2></center> |
| (රූපය 1) | (රූපය 2) |

රූපය 2 හි පෙන්වා ඇති ① - ③ දක්වා වූ ලේබල සඳහා ගැළපෙන උසුලන නිවැරදි අනුපිළිවෙළට දක්වා ඇත්තේ කුමන වරණයේ ද?

(1) U, B, S (2) EM, P, S

(3) EM, BR, S (4) I, BR, STRONG



Scanned with CamScanner

(26) <table border="1" width="100" height="50" cellpadding="5" cellspacing="5" bordercolor="cyon" bgcolor="Red">

ඉහත දැක්වෙන Table උසුලනයට අදාළ HTML කේතය අනුව, දක්නට ලැබෙන ගුණාංග සංඛ්‍යාව කොපමණ ද?

(1) 5 (2) 7 (3) 14 (4) 15

• නිවාඩු කාලයෙහි කිරීමට නියමිත පැවරුම් විද්‍යුත් තැපැල (E-mail) හරහා තම සිසුන් වෙත යැවීමට තොරතුරු තාක්ෂණ ගුරු භවතා තීරණය කර ඇති අතර එහි පිටපතක් අංශභාර ගුරු භවතාට ද, තවත් පිටපතක් ළමුන්ට නොපෙනෙන ලෙස විදුහල්පතිතුමන් වෙත යැවීමට ද අදහස් කරයි. මේ අනුව ප්‍රශ්න අංක 27 සිට 29 දක්වා පිළිතුරු සපයන්න.

(27) අංශභාර ගුරුභවතාගේ විද්‍යුත් ලිපිනය සඳහන් කළ යුත්තේ E-mail පණිවිඩයේ කුමන ස්ථානයේ ද?

(1) To (2) Cc (3) Bcc (4) Subject

(28) විදුහල්පති විද්‍යුත් ලිපිනය සඳහන් කළ යුත්තේ E-mail පණිවිඩයේ කුමන ස්ථානයේ ද?

(1) To (2) Cc (3) Bcc (4) Subject

(29) pdf ගොනුවක් ලෙස සැකසූ පැවරුම් විද්‍යුත් ලිපිය සමඟ සම්බන්ධ කිරීම සඳහා යොදා ගනු ලබන්නේ කුමක් ද?

(1) Subject (2) Attachment (3) Draft (4) Sent

(30) දකුණු පස දැක්වෙන රූප සටහන පිළිබඳව දක්වා ඇති පහත ප්‍රකාශ සලකන්න.

A. 1 රූපය වෙක්ටර් මාධ්‍යයෙන් ද,
2 රූපය රාස්ටර් මාධ්‍යයෙන් ද නිර්මාණය කර ඇත.

B. 1 රූපය රාස්ටර් මාධ්‍යයෙන් ද,
2 රූපය වෙක්ටර් මාධ්‍යයෙන් ද නිර්මාණය කර ඇත.



1 රූපය 2 රූපය

C. 1 රූපය නිර්මාණයට Corel Draw මෘදුකාංගය ද,
2 රූපය නිර්මාණය කිරීමට GIMP මෘදුකාංගය ද යොදා ගත හැකිය.

D. 1 රූපය නිර්මාණයට GIMP මෘදුකාංගය ද,
2 රූපය නිර්මාණය කිරීමට Corel Draw මෘදුකාංගය ද යොදා ගත හැකිය.


ඉහත ප්‍රකාශ අතරින් නිරවද්‍ය ප්‍රකාශය/ප්‍රකාශ දක්වෙන්නේ කුමන වරණයේ ද?

(1) A හා B පමණි (2) B හා C පමණි (3) A හා C පමණි (4) B හා D පමණි



Scanned with CamScanner

(31) ශ්‍රව්‍ය සංස්කරණ මෘදුකාංගයක දක්නට ලැබෙන පරිවහන මෙවලම් තීරුවක් (Transport Toolbar) පහතින් දක්වේ.




එහි A, B හා C යන කොටස් පිළිවෙලින් නම් කර ඇත්තේ කුමන වරණයේ ද?

(1) ක්‍රියාකරවීම, නැවැත්වීම, පටිගත කිරීම.
(2) තේරීම, කප්පාදු කිරීම, නැවැත්වීම.
(3) නැවැත්වීම, තේරීම, කප්පාදු කිරීම.
(4) පටිගත කිරීම, ක්‍රියාකරවීම, නැවැත්වීම.

(32) අංකිත ග්‍රාපිකයක මූලිකාංග මොනවා ද?

A. පික්සල්
B. විභේදනය
C. ප්‍රමාණය
D. වර්ණය

(1) A හා B පමණි
(2) B, C හා D පමණි
(3) A, B හා C පමණි
(4) A, B, C හා D පමණි

(33) තාර්කික ආරක්ෂාව (Logical Security) සඳහා ගත හැකි ක්‍රියාමාර්ග පමණක් අඩංගු පිළිතුර කුමක් ද?

(1) මෘදු ගිනිපවුර (Software Firewall), මුරපදය (Password), දත්ත අනුපිටපත් (Data Backup)
(2) අනවරත බල සැපයුම (UPS), මුරපදය (Passward), සර්ජන ආරක්ෂක (Surge Protector)
(3) දත්ත අනුපිටපත් (Data Backup), දෘඩ ගිනිපවුර (Hardware Firewall), අනවරත බල සැපයුම (UPS)
(4) සර්ජන ආරක්ෂක (Surge Protector), සංවෘත පරිපථ රූපවාහිනී (CCTV), දෘඩ ගිනිපවුර (Hardware Firewall)

(34) පරිගණකය භාවිතා කිරීමේ දී නිවැරදි ඉරියව්වකින් අසුන් ගැනීමෙන් බොහෝ සෞඛ්‍ය ගැටලු මගහරවා ගත හැකිය. නිවැරදි ඉරියව්ව සහිත වරණය කුමක් ද?

(1) පරිගණක තිරය ඇසට කෙලින් තබා ගත යුතුය.
(2) පරිගණක තිරය හා ඇස් අතර පරතරය සෙ.මී. 45-70 අතර විය යුතුය.
(3) කකුල් පොළවට සමාන්තර විය යුතුය.
(4) යතුරු පුවරුව වැලමිටට ඉහළින් තබා ගත යුතුය.

(35) පරිගණක පද්ධතියක් භාවිතා කිරීමේදී විවිධාකාර තර්ජන හා බලපෑම් ඇති වේ. ෆිෂින් ප්‍රහාරය ඉන් එක් බලපෑමකි. ෆිෂින් ප්‍රහාරය යනුවෙන් කුමක් අදහස් වේ ද?

(1) අනවසර විද්‍යුත් තැපැල් වේ.
(2) පරිශීලකයින් රවටා ඔවුන්ගේ බැංකු ගිණුම් හෝ විද්‍යුත් ගිණුම් ආදියෙහි තොරතුරු ලබා ගැනීම වේ.
(3) ස්වයංක්‍රීයව ක්‍රියාත්මක වන හානිකර මෘදුකාංගයක් වේ.
(4) පරිශීලකයින් රවටා වෙනත් වෙබ් පිටුවලට සම්බන්ධ කිරීම වේ.



Scanned with CamScanner

9726

(36) Pascal ක්‍රමලේඛන භාෂාව තුළ හඳුන්වන නම් කිරීමේ දී අනුගමනය කළ යුතු නිවැරදි නීති ඇතුළත් ප්‍රකාශන මොනවා ද?

A. හඳුන්වන නාමය අකුරකින් ආරම්භ විය යුතු ය.

B. හඳුන්වන නාමයේ අනුලක්ෂණ අතර හිස් අවකාශ පැවතිය නොහැක.

C. හඳුන්වන නාමයක් සඳහා ඇවුරුණු පද භාවිත කළ නොහැක.

D. හඳුන්වන නාමයක වලංගු අනුලක්ෂණ ලෙස අකුරු, ඉලක්කම් හා යටි ඉර පමණක් භාවිත කළ හැක.

(1) A හා B පමණි

(2) B හා C පමණි

(3) A, B හා C පමණි

(4) A, B, C, D සියල්ලම

(37) දී ඇති ව්‍යාජ කේතයෙහි ප්‍රතිදානය කුමක්ද?

(1) 1 1 2 3 5 8

(2) 1 2 3 5

(3) 1 2 3 5 8 13

(4) 1 2 3 5 8

```
begin
a = 0
b = 1
count = 1
while count <> 6
     count = count+1
     c = a+b
     a = b
     b = c
   display b
end while
end
```

• අංක 38 සිට 39 තෙක් ප්‍රශ්න සඳහා පහත දී ඇති ගැලීම් සටහන පාදක කර ගන්න.


(38) පහත ගැලීම් සටහනේ කවර ගැලීම් ව්‍යුහ භාවිතා කර තිබේ ද?

(1) අනුක්‍රමය හා වරණය පමණි

(2) අනුක්‍රම හා පුනර්කරණය පමණි

(3) වරණය හා පුනර්කරණය පමණි

(4) අනුක්‍රමය, වරණය හා පුනර්කරණය පමණි




(39) ගැලීම් සටහනේ ප්‍රතිදානය කුමක්ද?

(1) 1 2 3 4 5 6

(2) 1 3 5

(3) 2 3 6

(4) 1 2 3 6


(40) පහත දක්වෙන තර්කන පරිපථයේ ප්‍රතිදානය කවරක් ද?

(1) $A+B+C+\overline{D}$

(2) $A+B+C.\overline{D}$

(3) $A.B.C+\overline{D}$

(4) $(A+B+C).\overline{D}$






Scanned with CamScanner

9726

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# වර්ෂ අවසාන ඇගයීම
# ஆண்டிறுதி மதிப்பீடு - 2020
# Year End Evaluation

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade 11 | විෂයය / பாடம் / Subject තොරතුරු සන්නිවේදන තාක්ෂණය I,II | පත්‍රය / வினாத்தாள் / Paper II |

සැලකිය යුතුයි:

i) පළමුවන ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.


ii) පළමුවන ප්‍රශ්නයට ලකුණු 20ක් හිමි වන අතර, අනෙකුත් සෑම ප්‍රශ්නයකට ම ලකුණු 10 බැගින් හිමි වේ.

1. (i) (a) කමනි විසින් එක්තරා භාණ්ඩයක් පිළිබඳව වැඩි දුර විස්තර ලබා ගැනීම සඳහා, සඟරාවක මුද්‍රණය කර ඇති එම භාණ්ඩයට අදාළ මුද්‍රිත QR කේතය ඇයගේ ජංගම දුරකථනයේ කැමරාව ආධාරයෙන් සුපරීක්ෂා කර ඇයගේ ජංගම දුරකථනයේ ස්ථාපිත QR කේත විකේතනය කිරීමේ යෙදුම් මෘදුකාංගයකට ඇතුළත් කළ විට එම භාණ්ඩයට අදාළ වෙබ් පිටුව ඇයගේ ජංගම දුරකථනයේ දර්ශනය වේ. මෙම ක්‍රියාවලියට අදාල අදාන, ක්‍රියාවලිය සහ ප්‍රතිදාන වෙන් වෙන් වශයෙන් දක්වන්න.

(ii) (a) $8AE_{16}$ යන ෂඩ්දශමය සංඛ්‍යාව, අෂ්ටමය සංඛ්‍යාවක් බවට පරිවර්තනය කරන්න. ඔබගේ ගණනය කිරීමට අදාල පියවර ලියා දක්වන්න.

(b) $258_{10}$ යන දශමය සංඛ්‍යාවට අදාල BCD අගය ලියා දක්වන්න. ඔබගේ ගණනය කිරීමට අදාළ පියවර ලියා දක්වන්න.


(iii)




(a) ඉහත දක්වෙන තාර්කික පරිපථයට අදාල බූලීය ප්‍රකාශනය ලියා දක්වන්න.

(b) A සහ B සඳහා ආදානය ලෙස 1 ලබා දුන් විට ලැබෙන ප්‍රතිදානය කුමක් ද?

(iv) පරිගණකය සතු කෙවෙනි කිහිපයක් Ⓐ → Ⓔ දක්වා ලේබල්වලින් දක්වා ඇත.

| | | | | |
|---|---|---|---|---|
|  |  |  |  |  |
| Ⓐ | Ⓑ | Ⓒ | Ⓓ | Ⓔ |



Scanned with CamScanner

පහත දැක්වෙන එක් එක් කාර්යයන්ට ගැලපෙන කෙවෙනියට අදාල ලේබලය, අදාල කාර්යයයේ අංකය ඉදිරියෙන් ලියා දක්වන්න.


<u>කාර්යය ලැයිස්තුව :</u>

(1) ඩිජිටල් කැමරාවක් පරිගණකයට සම්බන්ධ කිරීම
(2) මොඩමය පරිගණකයට සම්බන්ධ කිරීම
(3) පරිගණකය ජාල ස්විචයට (Network switch) සම්බන්ධ කිරීම
(4) බහු මාධ්‍ය ප්‍රක්ෂේපකයක් නවීන උකුල් පරිගණකයට (Laptop) සම්බන්ධ කිරීම

(v) පහත දැක්වෙන වගුවේ, මෙහෙයුම් පද්ධතියක් විසින් ඉටු කරන කළමනාකරණ කාර්යයන් (1) තීරුවේ දක්වෙන අතර එම එක් එක් කාර්යයන් යටතේ සලසනු ලබන සේවාවන් (2) තීරුවේ දක්වා ඇත. මෙම තීරු දෙකේ අයිතම ගලපා අදාළ යුගල ලේබල මඟින් ලියා දක්වන්න.

| ① තීරුව | ② තීරුව |
|---|---|
| A. උපාංග කළමණාකරණය | P. අනිෂ්ට මෘදුකාංග වලින් පරිගණක පද්ධතිය ආරක්ෂා කරයි. |
| B. ගොනු කළමණාකරණය | Q. ගොනුවල සහ ෆෝල්ඩරවල නම වෙනස් කිරීමට උපකාරී වේ. |
| C. ආරක්ෂණ කළමණාකරණය | R. පරිගණකයේ ඇති විවිධ ක්‍රියාවලි සඳහා අවශ්‍ය කරන මතකය වෙන් කර දෙයි. |
| D. මතක කළමණාකරණය | S. විවිධ පර්යන්ත උපාංග පාලනය කරයි. |

(vi) වදන් සැකසුම් මෘදුකාංගයක දක්නට ලැබෙන මෙවලම් කිහිපයක් පහත ලේබල් කර ඇත




පහත දැක්වෙන එක් එක් කාර්යයන් ඉටු කර ගැනීමට යොදාගත හැකි මෙවලමට අදාල ලේබලය ඉහත වගුවෙන් තෝරා හිස්තැන් පුරවන්න.

(a) microsoft word ලෙස යතුරු ලියනය කර ඇති වචන පේළිය එක්වරම Microsoft Word ලෙස වෙනස් කිරීමට ........................... මෙවලම යොදා ගත හැකි ය.

(b) පුවත්පත්, සඟරා ආදිය නිර්මාණයේදී භාවිතා වන තීරු ලිපි සකස් කිරීමට ..................... මෙවලමය යොදා ගත හැකි ය.

(c) යතුරු ලියනය කරන ලද ඡේද දෙකක් අතර පරතරය වෙනස් කිරීමට ........................... මෙවලම යොදා ගත හැකි ය.

(d) පිටුවකට බෝඩරයක් එක් කර ගැනීම ................................. මෙවලම යොදා ගත හැකි ය.



Scanned with CamScanner

(vii) Ⓐ → Ⓓ ලෙස පහත දී ඇති වගන්තිවල හිස්තැන් පිරවීම සඳහා ඒ සමඟ වරහන් තුළ දී ඇති පද දෙක අතරින් වඩාත් යෝග්‍ය පදය තෝරා ලියන්න. (ඔබේ පිළිතුරෙහි වගන්ති ලේබලය හා හිස්තැනට අදාළ පදය පමණක් ලියන්න)

Ⓐ - ............................ (Bluegriffon/Dream weaver) යනු විවෘත කේත වෙබ් සංස්කාරක මෘදුකාංගයකි.

Ⓑ - වෙබ් අඩවියක සන්ධාරය නිරන්තරයෙන් වෙනස් වන්නේ නම් එය ........................ (ස්ථිතික/ගතික) වෙබ් අඩවියක් ලෙස හැඳින්වේ.

Ⓒ - වෙබ් සේවාදායකයාට සහ දත්ත පාදකවලට අදාළ නඩත්තු කටයුතු ........................ (වෙබ් අඩවි පරිපාලක/වෙබ් අඩවි සංස්කාරක) විසින් සිදු කරයි.

Ⓓ - වෙබ් අඩවියක් අන්තර්ජාලය තුළ ප්‍රකාශ කිරීම සඳහා වෙබ් අඩවියටම අනන්‍ය වූ ............ (වෙබ් සත්කාරක සේවාවක්/වසම් නාමයක්) මිලදී ගත යුතුය.

(viii) අංකිත ග්‍රාපික පිළිබඳව පහත දක්වා ඇති වගන්ති සත්‍ය හෝ අසත්‍ය බව අදාල වගන්ති ලේබලයට ඉදිරියෙන් දක්වන්න.

A. පික්සලයක් යනු අංකිත ග්‍රාපිකයක මූලික තැනුම් ඒකකය වන අතර ග්‍රාපිකයකට යොදා ඇති වර්ණ පික්සලයක බිටු ප්‍රමාණය නියෝජන කරයි.

B. විවිධ වර්ණයෙන් යුක්ත පික්සෙල් අරාවකින් රාස්ටර් ග්‍රාපිකයක් සෑදී ඇත.

C. අංකිත ග්‍රාපිකයක භෞතික පරිමාණය මැනීමේ ඒකකය ග්‍රාපික විභේදනය ලෙස හැඳින්වේ.

D. GIF සහ PNG යනු ග්‍රාපික සංකෝචනයේදී යොදා ගන්නා හානි වන ගොනු ආකෘති කිහිපයකි.

(ix) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතයේදී ඇතිවන ගැටලු සම්බන්ධව පහත දී ඇති වගන්ති සලකන්න.

අංක ① සිට ④ දක්වා දී ඇති වගන්තිවලට ගැළපෙන පදය පහත පද ලැයිස්තුවෙන් තෝරාගෙන අදාළ වගන්ති අංකයට ඉදිරියෙන් ලියා දක්වන්න.

① අනෙකුත් ජාල සමඟ සම්බන්ධතා තබාගනිමින් ස්වයංක්‍රීයව ක්‍රියාත්මක වීමේ හැකියාව ඇති හානිකර පරිගණක මෘදුකාංගයකි.

② පුද්ගලයෙකු විසින් රචිත ගීත ඇල්බමයක් මිලදී ගෙන එය සංඛ්‍යාංක බහුවිධ තැටි වලට පිටපත් කර විකුණා මුදල් උපයා ගනී.

③ උරහිසේ සිට අතේ ඇඟිලි දක්වා වේදනාවක් ඇති වන අතර එම ස්ථානවල ඉදිමුම මෙන්ම තද ගතියක්ද ඇතිවේ.

④ විවිධ කූට උපක්‍රම යොදා ගනිමින් පුද්ගලයන් නොමග යවමින් ඔවුන් පිළිබඳ ව්‍යාජ තොරතුරු සහ ඡායාරූප අන්තර්ජාලයට මුදාහරියි.

පද ලැයිස්තුව : [සයිබර් අපරාධ (Cyber Crime), වංචා, සමාජ ජාල වෙබ් අඩවි, පුනර්වර්ති ආතති පීඩාව (Repetitive Strain Injury), කාපල දෝනා සහලක්ෂණය (Carpel Tunnel Syndrome), ලිඛිත දෑ සොරකම, පරිගණක වර්මස්, බොට්ස්]



Scanned with CamScanner

(x) පහත දැක්වෙන්නේ 1 සිට 10 දක්වා අනුයාත සංඛ්‍යා අවරෝහණ පිළිවෙලට දර්ශනය කිරීමට අදාල පැස්කල් ක්‍රමලේඛයකි. එහි (Q), (R), (S) සහ (T) ලෙස පෙන්වා ඇති ලේබල සඳහා නිවැරදි පද ලියා දක්වන්න.

```
program printDecOrder (input,Output);

(Q)count := integer;

Begin

        For(R) := 10(S) 1 do

        writeln ((T));
End
```

2. පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

(i) කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව ඔවුන්ගේ පරිගණක පද්ධතිය භෞතිකව ආරක්ෂා කර ගැනීමට අදහස් කරයි. ඒ සඳහා ඔවුනට ගත හැකි පියවර දෙකක් දක්වන්න.

(ii) ශ්‍රී ලංකා පොලිසිය අපරාධකරුවන් පිළිබඳව පරිගණකගත දත්ත සමුදායක් පවත්වාගෙන යයි. එම දත්ත සමුදායේ තාර්කික ආරක්ෂාව සඳහා ගත හැකි පියවර දෙකක් දක්වන්න.

(iii) හසුරු කුසලතා අහෝසි වීම තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ අතුරු ප්‍රතිඵලයකි. ඒ සඳහා උදාහරණ දෙකක් ලියා දක්වන්න.

(iv) සයිබර් ආරක්ෂාව සපයන ශ්‍රී ලංකාවේ ආයතනයක් සඳහන් කරන්න.

(v) (A) සිට (F) දක්වා ලේබල් කර ඇති වගන්ති සලකා බලා පහත දී ඇති ලැයිස්තුවේ සඳහන් පද අතරින් ඒ ඒ ලේබලය සඳහා වඩාත්ම ගැලපෙන පදය හඳුනා ගන්න. එක් එක් පිළිතුර සඳහා වගන්ති ලේබලය හා අදාල පදය ලියා දක්වන්න.

(A) අංකිත සේතුව ඇති කිරීම සඳහා ගත හැකි පියවරකි.

(B) අතේ ඇඟිලිවල ඇතිවන හිරිවැටීම හා වේදනාව

(C) නිර්මාණකරුවකුගේ අදහස්, රචනා හෝ වෙනත් නිර්මාණයක් පිටපත් කර ගනිමින් ඔහුගේ අවසරයකින් තොරව එය තමාගේ නිර්මාණයක් ලෙස ඉදිරිපත් කිරීම.

(D) ශ්‍රී ලංකාව පිළිබඳව විද්‍යුත් ලිපියක් ලිවීමේදී තොරතුරු ලබාගත් වෙබ් පිටු, ලිපිය අවසානයේදී සඳහන් කිරීම.

(E) අන්තර්ජාලය හරහා පරිශීලකයන් රවටා ඔවුන්ගේ බැංකු ගිණුම් ආදියෙහි තොරතුරු ලබා ගැනීම.

(F) ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය ආරක්ෂාකාරී ව බැහැර කල හැකි ආකාරයකි.

ලැයිස්තුව : [ලිඛිත දෑ සොරකම, පුනර්වර්ති ආතති පීඩාව, හැකින්, ගෙනහැර දැක්වීම, ප්‍රතිචක්‍රීකරණය, අංකිත බෙදුම ඇති කිරීම, කාපල දෝනා සහලක්ෂණය, ෆිෂින්, අංකිත සාක්ෂරතාව ඇති කිරීම, යොමුව දැක්වීම ]



Scanned with CamScanner

9726

3. පහත පෙන්වා ඇත්තේ පෞද්ගලික රෝහලක එහි රෝහල් කළමනාකරණ පද්ධතියට අදාළ සම්බන්ධිත දත්ත සමුදායක වගු කොටස් කිහිපයකි.

**Patient** වගුව (රෝගීන් පිළිබඳ විස්තර අඩංගු වේ)

| patient_number | name | telephone_number |
|---|---|---|
| P0001 | සුනිල් වීරසිංහ | 0772035480 |
| P0002 | මොහොමඩ් මුස්තාෆා | 0751556977 |
| P0003 | මැල්කම් අයිවන් | 0715689243 |
| P0004 | සුජාතා අත්තනායක | 0786238146 |
| P0005 | ජෙසිකා පෙරේරා | 0763569814 |

**Physician** වගුව (වෛද්‍යවරුන් පිළිබඳ විස්තර අඩංගු වේ)

| physician_no | name | specialties | telephone_number | charges_per_patient |
|---|---|---|---|---|
| D1001 | සුසිල් විජේසුන්දර | නාරි හා ප්‍රසව | 0715264259 | 1100 |
| D1002 | ගාමිණී විජේතුංග | දන්ත | 0772398654 | 1000 |
| D1003 | විජේදාස සමරතුංග | අක්ෂි | 0776974238 | 1200 |
| D1004 | සුනීතා රාජපක්ෂ | ශල්‍ය වෛද්‍ය | 0716512398 | 1300 |
| D1005 | ජාමිල් ජමීල් | ශල්‍ය වෛද්‍ය | 0768912356 | 1400 |

**reservation** වගුව (වෛද්‍යවරුන් පිළිබඳ විස්තර අඩංගු වේ)

| patient_number | physician_no | date |
|---|---|---|
| P0002 | D1003 | 2020/02/10 |
| P0003 | D1002 | 2020/02/11 |
| P0001 | D1003 | 2020/02/12 |
| P0004 | D1001 | 2020/02/12 |
| P0001 | D1002 | 2020/02/13 |
| P0002 | D1005 | 2020/02/14 |

(i) ඉහත දත්ත සමුදායේ ප්‍රාථමික යතුරු දෙකක් අදාළ වගුවල නම් සමඟ ලියා දක්වන්න.

(ii) පහත දැක්වෙන වෙනස්කම් සිදු කිරීමේ දී යාවත්කාලීන කළ යුතු වගු(ව) කුමක් ද?

(a) ජෙසිකා පෙරේරා 2020/02/16 දින ගාමිණී විජේතුංග යන දන්ත වෛද්‍යවරයා හමු වීම.

(b) ප්‍රේමලාල් විජේසුන්දර යන නාරි හා ප්‍රසව නව වෛද්‍යවරයකු රෝහලට බඳවා ගැනීම.

(iii) (a) ඉහත (ii) (a) කොටසේ සඳහන් වෙස්කම් සිදු කිරීමට අදාළ වගුව(ල) ට ඇතුළත් කළ යුතු නව රෙකෝඩ(ය) වගු නාමය → (ක්ෂේත්‍රය 1, ක්ෂේත්‍රය 2....) ආකාරයට ලියා දක්වන්න.

(b) ප්‍රේමලාල් විජේසුන්දර යන නව නාරි හා ප්‍රසව වෛද්‍යවරයා හමුවීමට 0778529634 යන දුරකතන අංකය හිමි නීලා අමරසිරි යන රෝගියා 2020/02/16 දින රු. 1500 මුදලක් ගෙවීමෙන් පසු රෝහල ඔවුන්ගේ අයකිරීම වන රු. 400 මුදල එම මුදලෙන් ලබා ගන්නා ලදී. මේ වෙනස්කම සඳහා අදාළ වගුව(ල)ට ඇතුළත් කළ යුතු නව රෙකෝඩ(ය) වගුනාමය → (ක්ෂේත්‍රය 1, ක්ෂේත්‍රය 2....) ආකාරයට ලියා දක්වන්න.

(iv) සුසිල් විජේසුන්දර යන වෛද්‍යවරයාහට පෙබරවාරි මාසය තුළ ගෙවිය යුතු මුළු මුදල ගණනය කිරීම සඳහා විමසුමක් ලිවීමට සම්බන්ධ කළ යුතු වගු(ව) මොනවා ද?



Scanned with CamScanner

4. (i) ① සිට ⑧දක්වා ලේබල් කර ඇති විස්තර සහිත වගන්ති සලකන්න. දී ඇති ලැයිස්තුවේ සඳහන් පද අතරින් හිස්තැන් පිරවීම සඳහා වඩාත් යෝග්‍යය පදය ලියා දක්වන්න.

A http://www.elearning.lk/ICT/Grade 10/lesson 1.pdf URL හි elearning.lk වසම් නාමය වන අතර ① ................................ ඉහළ මට්ටමේ වසම් නාමයයි. ②................................ යනු ගොනුව පවතින ස්ථානයයි.

B ③ ................................ අන්තර්ජාලයට පිවිසීමට යොදා ගනු ලබන මෘදුකාංගය වන අතර ④ ................................ ඒ සඳහා උදාහරණයක් වේ.

C ⑤ ................................ ලිපිනය සෑම පරිගණකයක්ම අන්තර් ජාලයේදී අනන්‍යව හඳුනා ගැනීමට භාවිතා කරනු ලබයි.

D ⑥ ................................ නියමාවලිය මගින් දෝෂ පවතින අවස්ථාවලදී පණිවඩ දැනුම්දීම සිදු කරයි.

E සේවාලාභී පරිගණකයක ඇති ගොනු අන්තර්ජාලයට මුදා හැරීම සඳහා ⑦ ................................ නියමාවලිය භාවිතා වේ.


F ⑧ ................................ යැවීමට සකස් කළ නමුත් සම්පූර්ණ කරගත නොහැකි වූ ලිපි තැන්පත් කිරීමට භාවිතා කරන අතර යැවූ ලිපි Sent තුළ තැන්පත් වීම සිදුවේ.

ලැයිස්තුව ( **.lk, Draft, IP,** ඒකාකාර සම්පත් නිශ්චායකය, **ICMP,** වෙබ් අතිරික්සුව, මාර්ගගත ඉගෙනුම, **ICT/Grade 10, Chrome, FTP, lesson.pdf )**

(ii) (a) රූපය 2 හි දක්වා ඇති වෙබ් පිටුවෙහි HTML ප්‍රභව කේතය ① සිට ⑫ දක්වා ලේබල් කර ඇති උසුලන වල මූලිකාංග, ගුණාංග හෝ අගයන් නොමැතිව රූපය 1 මඟින් දක්වා ඇත. ① සිට ⑫ දක්වා ලේබල් කර ඇති ස්ථාන සඳහා සුදුසු පද දී ඇති ලැයිස්තුවෙන් ලියා දක්වන්න.

```
<html>
<①><title>සිසු රක්ෂණය</title></①>
<body>
<②><h2>සුරක්ෂා සිසු රක්ෂණය</h2>
<③ src="children.jpg" width="200" height="100" alt="stay home"><④>
<⑤ face="arial" size="3"> [illegible]</⑤></②>
<⑥ align="justify"> [illegible]
[illegible]
[illegible]</⑥>
<table ⑦= "3" align = "②">
<⑧ ><⑨>රක්ෂණාවරණය </⑨><⑨>හිමිවන මුදල</⑨></⑧ >
<⑧><⑩><⑪>
      <li>[illegible]</li>
      <li>[illegible]</li>
      <li>[illegible]</li>
      <li>[illegible]</li>
      </⑪>
  <⑩><⑪ type ="⑫">
      <li>200,000</li>
      <li>100,000</li>
      <li>75,000</li>
      <li>100,000</li>
  </⑩></⑧ >
</table>
<②><h3>වැඩි විස්තර සඳහා -: <a href="https //nie.lk/en/covid-19">
සිසු සුරක්ෂා රක්ෂණය</a></h3></②><body></html>
```

රූපය 1




රූපය 2

ලැයිස්තුව :- {ul, td, p img, border, center, br, tr, head, circle, font, th, ol, square}



Scanned with CamScanner

(b) ඉහත දක්වා ඇති වෙබ් පිටුව නිර්මාණය කර ඇත්තේ සිංහල යුනිකෝඩ් අකුරු යොදාගනිමිනි. මේ සඳහා ලේඛනය තැන්පත් කළ යුත්තේ කුමන ආකාරයට ද?

5. වෙළඳ සැලක ජනවාරි සහ පෙරබරවාරි මාස තුළ සහල් තොග මිල දී ගැනීම් පහත පැතුරුම්පත භාවිත කර ගණනය කරනු ලැබේ.

| | A | B | C | D | E | F | G | H | I | J | K | L | M | N |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | අයිතම | ඒකක මිල | මිලදී ගැනීම | | | | | | | | | | | |
| 2 | | | ජනවාරි | | | | | පෙබරවාරි | | | | | | |
| 3 | | | ප්‍රමාණය (kg) | වට්ටමට පසු ඒකක මිල | වට්ටමට පෙර මිල | වට්ටමට පසු මිල | ලාභය | ප්‍රමාණය (kg) | වට්ටමට පසු ඒකක මිල | වට්ටමට පෙර මිල | වට්ටමට පසු මිල | ලාභය | මුළු එකතුව | මුළු ලාභය |
| 4 | සුවදැල් | 200 | 500 | 180 | 100000.00 | 90000.00 | 10000.00 | 500 | 170 | 100000.00 | 85000.00 | 15000.00 | 175000.00 | 25000.00 |
| 5 | කුරුළුතුඩ | 100 | 500 | 90 | 50000.00 | 45000.00 | 5000.00 | 250 | 85 | 25000.00 | 21250.00 | 3750.00 | 66250.00 | 8750.00 |
| 6 | සුදු කැකුළු | 80 | 2000 | 72 | 160000.00 | 144000.00 | 16000.00 | 1500 | 68 | 120000.00 | 102000.00 | 18000.00 | 246000.00 | 34000.00 |
| 7 | රතු කැකුළු | 70 | 1500 | 63 | 105000.00 | 94500.00 | 10500.00 | 1000 | 59.50 | 70000.00 | 59500.00 | 10500.00 | 154000.00 | 21000.00 |
| 8 | කීරි සම්බා | 100 | 1500 | 90 | 150000.00 | 135000.00 | 15000.00 | 500 | 85 | 50000.00 | 42500.00 | 7500.00 | 177500.00 | 22500.00 |
| 9 | සම්බා | 80 | 3000 | 72 | 240000.00 | 216000.00 | 24000.00 | 2000 | 68 | 160000.00 | 136000.00 | 24000.00 | 352000.00 | 48000.00 |
| 10 | මුළු එකතුව | | | | | **724500.00** | **80500.00** | | | | **446250.00** | **78750.00** | **1170750.00** | **159250.00** |
| 11 | වැඩිම අගය | | | | | 216000.00 | 24000.00 | | | | 136000.00 | 24000.00 | 352000.00 | 48000.00 |
| 12 | | | | | | | | | | | | | | |
| 13 | වට්ටම | | | | | | | | | | | | | |
| 14 | ජනවාරි | 10% | | | | | | | | | | | | |
| 15 | පෙබරවාරි | 15% | | | | | | | | | | | | |
| 16 | | | | | | | | | | | | | | |

(i) ජනවාරි මාසයේ මුළු මිලදී ගැනීම් සඳහා වැය වූ මුදල ගණනය කිරීම සඳහා F10 කෝෂයට ඇතුළත් කළ යුතු සූත්‍රය =ශ්‍රිතය1 (කෝෂය 1: කෝෂය 2) ආකාරයට ලියා දක්වන්න.

(ii) (a) ජනවාරි මාසයේ සුවදැල් සඳහා වට්ටමට පසු ඒකක මිල ගණනය කිරීම සඳහා D4 කෝෂයට ඇතුළත් කළ යුතු සූත්‍රය ලියා දක්වන්න.

අදාළ මාසයේ අයිතමයක වට්ටමට පසු ඒකක මිල = අයිතමයේ ඒකක මිල - (අයිතමයේ ඒකක මිල * අදාළ මාසයේ වට්ටම)

(b) ජනවාරි මාසයේ සුදු කැකුළු සඳහා ඉහත (ii) (a) හි සූත්‍රය පිටපත් කළේ නම් D6 කෝෂයේ දිස්වන සූත්‍රය ලියා දක්වන්න.

(iii) (a) ජනවාරි මාසයේ සුවදැල් සඳහා වට්ටමට පසු මිල ගණනය කිරීම සඳහා F4 කෝෂයට ඇතුළත් කළ යුතු සූත්‍රය ලියා දක්වන්න.

අදාළ මාසයේ අයිතමයක වට්ටමට පසු මිල = අයිතමයේ වට්ටමට පසු ඒකක මිල * ප්‍රමාණය

(b) ජනවාරි මාසයේ සුවදැල් සඳහා ලාභය ගණනය කිරීම සඳහා G4 කෝෂයට ඇතුළත් කළ යුතු සූත්‍රය ලියා දක්වන්න.

අදාළ මාසයේ අයිතිමයක ලාභය = අයිතමයේ වට්ටමට පෙර මිල - අයිතමයේ වට්ටමට පසු මිල


(iv) සුවදැල් සහල් සඳහා ජනවාරි හා පෙබරවාරි මාසයේ මුළු මිලදී ගැනීම් සඳහා වැය වූ මුදල ගණනය කිරීම සඳහා M4 කෝෂයට ඇතුළත් කළ යුතු සූත්‍රය ලිවිය හැකි ආකාර දෙකක් දක්වන්න.

(v) ජනවාරි හා පෙබරවාරි මාසය තුළ අයිතම සඳහා ලැබූ ලාභවලින් ලැබුණු වැඩිම ලාභය ගණනය කිරීම සඳහා N11 කෝෂයට ඇතුළත් කළ යුතු සූත්‍රය ලියා දක්වන්න.



Scanned with CamScanner

6. පද්ධති සංවර්ධන ජීවන චක්‍රයේ ප්‍රධාන පියවර හය පහත රූප සටහනේ දැක්වේ. ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුරු සපයන්න.




(i) ඉහත සටහනේ Ⓐ Ⓑ සහ Ⓒ යන ලේබලයන්ට ගැලපෙන පියවර අදාල ලේබලයට ඉදිරියෙන් ලියා දක්වන්න.

(ii) අවශ්‍යතා හඳුනාගැනීමේ පියවරේදී නව පද්ධතිය පිළිබඳ ලිඛිත සටහන් තබා ගන්නා කරුණු තුනක් නම් කරන්න.

(iii) පහත Ⓟ → Ⓣ දක්වා ඇති කාර්යයන් අතරින් ඉහත Ⓐ පියවරේදී සිදු කරන කාර්යයන් සඳහා ✓ ලකුණ ද සිදු නොකරන කාර්යයන් සඳහා × ලකුණද යොදන්න.

(ඔබේ පිළිතුරෙහි අදාල කාර්යයේ ලේබලයට ඉදිරියෙන් ✓ හෝ × බව දක්වන්න)

| | | |
|---|---|---|
| Ⓟ | ප්‍රධාන දෘඩාංග පද්ධති හා ඒවායේ සංඝටක හඳුනා ගැනීම | |
| Ⓠ | පරීක්ෂණ සැලසුම් කිරීම | |
| Ⓡ | පද්ධතියේ දෝෂ හඳුනා ගැනීම | |
| Ⓢ | සුදුසු පරිගණක භාෂාවක් යොදා ගනිමින් පද්ධතිය කේතනය කිරීම | |
| Ⓣ | මෘදුකාංග නිර්මිතය හඳුනා ගැනීම | |
| Ⓤ | පද්ධතියේ අරමුණු හඳුනා ගැනීම | |
| Ⓥ | අතුරු මුහුණත් සහ දත්ත ගබඩා සැකසීම | |

(iv) පද්ධතිය පිහිටුවීමේ ක්‍රම දෙකක් සඳහන් කර ඒ පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න.


(iv) දියඇලි ආකෘතිය සහ පුනර්කරණ වෘද්ධි ආකෘතිය අතර වෙනස්කම් දෙකක් සඳහන් කරන්න.



Scanned with CamScanner

9726

7. ජනාධිපතිවරණයක් සඳහා දේශපාලන පක්ෂ හතරකින් අපේක්ෂකයින් හතරදෙනකු ඉදිරිපත් වේ. ඡන්ද පොළ නිලධාරියෙකු විසින් ඡන්දදායකයාගේ අනන්‍යතාව පරීක්ෂා කිරීමෙන් පසු ඡන්දය ප්‍රකාශ කිරීමට සුදුසුකම තිබේ. **(eligibility for voting)** නම් ඡන්දදායකයා විසින් අපේක්ෂකයින් හතරදෙනා අතරින් එක් අපේක්ෂකයෙකුට පමණක් තම මනාපය අපේක්ෂකයාට අදාළ අංකය මඟින් **(vote by the relevant candidate number)** ප්‍රකාශ කළ යුතු ය. ඡන්දදායකින් ඡන්දය ප්‍රකාශ කර අවසන් **(voting is over)** නම් මෙම ක්‍රියා නවතා දමන අතර අවසන් නොවේ නම් තවදුරටත් මේ කාර්යය පුනර්කරණය කරයි. ජනාධිපතිවරණය අවසානයේ එක් එක් අපේක්ෂකයා ලබාගත් මනාප ගණන දර්ශනය කරයි. මේ සඳහා අඳින ලද ගැලීම් සටහන පහත දැක්වේ.






Scanned with CamScanner